# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1986 අංක 31 දරන
## ණය සහන සභා (ඉවත් කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1986 සැප්තැම්බර් මස 23 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1986 සැප්තැම්බර් මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.**

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී**

**කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය**

**මිළ ශත : 45 යි.** තැපැල් ගාස්තුව ශත : 75 යි.

# 1986 අංක 31 දරන ණය සහන සභා (ඉවත් කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1986 සැප්තැම්බර් මස 23 වන දින.]

එල්. ඩී.—ඕ. 36/85

**ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 23 දරන ණය සහන සභා පනත ඉවත් කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

**1.** මේ පනත 1986 අංක 31 දරන ණය සහන සභා (ඉවත් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර 1985 මැයි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 23 දරන පනත ඉවත් කිරීම සහ ඉතිරි කිරීම.

**2.** (1) (මෙහි මින් මතු 'ණය සහන සභා පනත' යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 23 දරන ණය සහන සභා පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) ඉහත කී පනත ඉවත් කරනු ලැබීම නොතකා—

(අ) ණය සහන සභා පනතේ 2 වන වගන්තිය මගින් පිහිටුවනු ලැබූ ණය සහන සභා දෙපාර්තමේන්තුව, එම දෙපාර්තමේන්තුවේ කටයුතු අවසන් කිරීමේ කාර්ය සඳහා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි දිනයක් දක්වා දිගටම කටයුතු කළ යුතු ය;

(ආ) ණය සහන සභාවක් මගින් දෙනු ලැබ මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී නොගෙවා ඉතිරිව ඇති ණය, එම ණය සහන සභාව පිහිටුවනු ලැබුවේ යම් දෙපාර්තමේන්තුවක් සඳහා ද එම දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා විසින් අය කරගනු ලැබිය යුතු අතර, දෙපාර්තමේන්තු සඳහා පිහිටුවනු ලැබූ ණය සහන සභා මගින් දෙනු ලැබ මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයේ දී නොගෙවා ඉතිරිව ඇති ණය, ඒ සඳහා ගෙවිය යුතු පොලිය ද සමඟ අයකර ගෙන ඒ මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට ආණ්ඩුවේ සෑම දෙපාර්තමේන්තු ප්‍රධානයෙකුම වෙත මෙයින් බලය පවරනු ලැබේ;

(ඇ) ණය සහන සභා පනතේ 2 වන වගන්තිය මගින් පිහිටුවනු ලැබූ ණය සහන සභා දෙපාර්තමේන්තුවේ මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී පවත්නා බැරකම් එම දිනයේ සිට බලපවත්නා පරිදි ඒකාබද්ධ අරමුදලට මාරු කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඈ) ණය සහන සභා පනතේ 7 වන වගන්තිය මගින් පිහිටුවනු ලැබූ ණය සහන සභා දෙපාර්තමේන්තුවේ මධ්‍යම අරමුදලට මේ පනත ක්‍රියාත්මක වන දිනයේ දී බැරව තිබෙන සියලුම මුදල් සහ ණය සහන සභා පනතේ 8 වන වගන්තිය යටතේ පවත්වා ගෙන යනු ලැබූ ණය සහන සභාවක සෑම

ප්‍රාදේශීය අරමුදලකටම බැරව මේ පනත ක්‍රියාත්මකවන දිනයේ දී යම් බැංකුවක ඇති සියලුම මුදල් ඒකාබද්ධ අරමුදලට මාරු විය යුතු අතර එම මුදල් ඒකාබද්ධ අර මුදලට බැර කිරීම සඳහා එවැනි සෑම බැංකුවකටම මෙයින් බලය පවරා අවසර දෙනු ලැබේ;

(ඉ) (i) 1985 දෙසැම්බර් මස 31 වන දින හෝ ඊට පෙර රජයේ සේවයේ නියුක්තව සිටීම අවසන් කරන සාමාජිකයකු විසින් ණය සහන සභා පනතේ 10 වන වගන්තිය යටතේ ණය සහන සභාවක් වෙත ගෙවනු ලැබ ඇති සියලුම දායක මුදල් එහි ලාභාංශ ද සමග රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් එම සාමාජිකයාට හෝ ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයාට ආපසු ගෙවනු ලැබිය යුතු ය;

(ii) 1986 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු රජයේ සේවයේ දිගටම නියුක්තව සිටින සාමාජිකයකු විසින් ණය සහන සංග පනතේ 10 වන වගන්තිය යටතේ ණය සහන සභාවක් වෙත ගෙවනු ලැබ ඇති සියලුම දායක මුදල්, එහි ලාභාංශ ද සමග එම ණය සහන සභාව පිහිටුවනු ලැබුවේ යම් දෙපාර්තමේන්තුවක් සඳහා ද එම දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා විසින් මේ පනත ක්‍රියාත්මක වීමෙන් පසු හැකි ඉක්මණින් එම සාමාජිකයාට හෝ ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයාට ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(iii) මේ වගන්තිය යටතේ කරනු ලබන සියලුම ආපසු ගෙවීම් ඒකාබද්ධ අරමුදලට වැය බරක් කරනු ලැබිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ගිණුම් තැබිය හැකිය.